# යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපයෙහි සංචාරක ප්‍රවර්ධනය සඳහා පවත්නා විභවතා පිළිබඳ අධ්‍යයනයක්

වයි.බී.එම්.එස්.පී. විජේබණ්ඩාර [1]

මුඛ්‍ය පදඃ යාපහුව, පුරාවිද්‍යා ක්ෂේත්‍ර, උරුමය, සංචාරක ප්‍රවර්ධනය, විභවතා

## හැඳින්වීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය දෙස් විදෙස් සංචාරක ආකර්ෂණයට ලක්වන ස්ථානයකි. ප්‍රධාන වශයෙන් මාලිගයක්, බලකොටුවක් වශයෙන් සුප්‍රසිද්ධ මෙම ස්ථානයෙහි ආගමික වශයෙන් වැදගත් ගොඩනැගිලි රාශියක් ද දැකගත හැකි ය. ක්‍රි.ව. 13 වන සියවසයෙහි බුවනෙකබාහු රජු විසින් මෙම බලකොටුව ගොඩනගා, එහි දළදා මාලිගයක් තනවා දළදාව තැම්පත් කොට වසර 12 ක පමණ කාලසීමාවක් ශ්‍රී ලංකාවෙහි අගනගරය වශයෙන් පාලන කටයුතු ගෙන ගොස් තිබේ. මෙම ප්‍රධාන යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය කේන්ද්‍ර කොට ගෙන අවට කලාපය තුළ පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා සුවිශේෂී සංස්කෘතික උරුම ක්ෂේත්‍ර කිහිපයක් ස්ථානගත වී පවතී. එනම් ප්‍රධාන වශයෙන් ඒ ආශ්‍රිත ව පිහිටා ඇති සමීපතම උරුම ක්ෂේත්‍රයක් වශයෙන් පිං වැව ගල්සොහොන් කනත්ත මෙගලිතික සුසාන භූමිය ඉතා වැදගත් වේ. මීට අමතරව කොණ්ඩදෙණිය රජමහා විහාරය සහ කයිකාවල රජමහා විහාරයන් ද යාපහුව තදාශ්‍රිතව ස්ථානගත වී පවතින පෞරාණික උරුම ක්ෂේත්‍ර වේ. සමස්තයක් වශයෙන් ගත් කළ මෙම ප්‍රදේශය ආශ්‍රිත සංචාරක කර්මාන්තය ඉතා සාමාන්‍ය මට්ටමක පවතී. ඒ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වනුයේ, යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපය සැලකිය යුතු සංස්කෘතික, ඓතිහාසික සහ වාස්තු විද්‍යාත්මක අගයක් පැවතිය ද, සංචාරක සංවර්ධනය සඳහා පවත්නා විභවතාවල ස්වරූපය කෙසේ ද යන්නයි. මෙහි පර්යේෂණ අරමුණ වනුයේ යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපයේ සංචාරක ප්‍රවර්ධනය සඳහා පවත්නා විභවතා අධ්‍යයනය කිරීම මෙන් ම එහි සංස්කෘතික, ඓතිහාසික සහ පාරිසරික වශයෙන් පවතින්නා වූ අගයන් හඳුනා ගැනීම, වර්තමාන අභියෝග සහ සීමාවන් තක්සේරු කිරීම මෙන්ම උරුම සංචාරක ගමනාන්තයක් ලෙස එහි ආකර්ෂණය වැඩි දියුණු කිරීම සඳහා තිරසාර උපාය මාර්ග යෝජනා කිරීමයි. එහිදි යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපය ආශ්‍රිත පවතින දුර්වලතා සහ තර්ජන හඳුනාගෙන ඒවාට නිසි විසඳුම් ලබා දෙමින් සංචාරක ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්නා ශක්තීන් සහ අවස්ථා හෙවත් විභවතා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ.

[1] පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sarangap789@gmail.com

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේද උපයෝගී කරගන්නා ලදි. ක්ෂේත්‍ර අධ්‍යයන යටතේ යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපය නිරීක්ෂණය කරන ලද අතර එම ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයින් සමඟ මෙන් ම එම ක්ෂේත්‍රයන් ආශ්‍රිත ප්‍රදේශ වාසීන්ගෙන් තෝරාගත් පිරිසක් සමඟ සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි වැනි පර්යේෂණ ක්‍රම මගින් දත්ත එක් රැස් කරන ලදි. ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යටතේ සංඛ්‍යා ලේඛන, පුස්තකාලය යනාදිය පරිශීලනය මගින් දත්ත ලබාගන්නා ලදි. ක්ෂේත්‍ර නිරීක්ෂණ, සරල සම්මුඛ සාකච්ඡා හා පුස්තකාල ලේඛන විශ්ලේෂණය ආදිය මගින් ලබාගත් දත්ත ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ අදාළ කාණ්ඩවලට යොදමින් දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම පර්යේෂණයේ දී ලබාගත් දත්ත අනුව යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිතව පවතින්නා වූ උරුම කලාපයෙහි සංචාරක ප්‍රවර්ධනය සඳහා පවත්නා විභවතා හඳුනා ගන්නා ලදි. එම විභවතාවන් හඳුනා ගැනීම සඳහා යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපයයෙහි පවතින සංචාරක ප්‍රවර්ධන දුර්වලතා සහ තර්ජන පිළිබඳ අධ්‍යයනය කර එම දුර්වලතා සහ තර්ජන මඟහරවා ගැනීම සඳහා පිළියම් වශයෙන් එම කලාපයෙහි පවතින්නා වූ ශක්තීන් සහ අවස්ථා හඳුනා ගන්නා ලදි. එම විභවතා වශයෙන්,

- ක්‍රි.ව. 13 වන සියවසය තුළ පැවති ශ්‍රී ලංකාවේ සිව්වන අගනගරය හෙවත් රාජධානිය වීම.
- පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් රාජ මාළිගා සංකීර්ණ, ආරක්ෂක බළකොටුවක නෂ්ටාවශේෂ, පැරණි සංඝාරාම සහ මහනුවර යුගයේ සිතුවම් පවතින ලෙන් විහාර යනාදී සංස්කෘතික වශයෙන් වැදගත් නිර්මාණ රාශියක් එකම ස්ථානයක පැවතීම.
- මෙම උරුමය ජනාකීර්ණත්වයෙන් තොර සාම්ප්‍රදායික සංස්කෘතික සමාජයකින් හෙබි වූ නිස්කලංක පරිසරයකට අයත් ව පැවතීම.
- කුරුණෑගල, දඹුල්ල, අනුරාධපුර වැනි සුප්‍රසිද්ධ උරුම ස්ථානයන් තරමක් දුරින් පැවතීම.

යාපහුව පුරාවිද්‍යා උරුම ක්ෂේත්‍රයට සමීපතව සෙසු උරුම ක්ෂේත්‍රයන් ස්ථානගත වී පැවතීම නිසා ගමනාගමනයේ පහසුව වැනි විභවතා රාශියක් හඳුනාගන්නා ලදි.

එමෙන් ම තදාශ්‍රිත ව පවතින උරුම ක්ෂේත්‍ර කලාපීය වශයෙන් වැදගත් වීමට ප්‍රාග් ඓතිහාසික අවධියට අයත් සාධක ලැබෙන ස්ථාන මේ ආශ්‍රිත ව දැකගත හැකි අතර එම ස්ථානයන් වශයෙන් යාපහු පර්වතය ආශ්‍රිත ලෙන් කිහිපයක්,

යාපහුව තදාශ්‍රිත ව පවතින මොනරකන්ද ආශ්‍රිත ලෙන්, දිවුල්ලෑව උස්ගල පර්වතය ආශ්‍රිත ව මෙන් ම කයිකාවල රජමහා විහාර භූමිය යනාදී ස්ථාන ආශ්‍රිත ව එම අවධියට අයත් සාධක ලැබී ඇත. පූර්ව ඓතිහාසික අවධියට අයත් සාධක ලැබෙන ස්ථාන වශයෙන් පින්වැව ගල්සොහොන් කනත්ත සුසාන භූමිය ප්‍රධාන වන අතර යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය ආශ්‍රිත බංගලාපිටිය යන ස්ථානයකින්ද එම අවධියට අයත් සාධක ලැබී ඇත.

## සමාලෝචනය

මෙම අධ්‍යයන තුළින් පැහැදිලිව ම යාපහුව පුරාවිද්‍යා ක්ෂේත්‍රය සහ තදාශ්‍රිත උරුම කලාපය ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා පවතින විභවතා කිහිපයක් දැකගත ය. මෙහි දී ඒ එක් එක් ක්ෂේත්‍ර සඳහා සංචාරක ප්‍රවර්ධනය සඳහා වෙන් වෙන් වූ සැලසුම්වලට සාපේක්ෂව එක් ප්‍රධාන උරුම ක්ෂේත්‍රයක් කේන්ද්‍ර කොට ගත් තවත් උරුම ක්ෂේත්‍රයන් එක් වූ ජාලගත සංචාරක සැලැස්මක් නිර්මාණය කිරීම ඉතා උපයෝගී වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය


සුධර්මාවතී, ජේ. එම්. (2000). ***දඹදෙණිය හා යාපහුව රාජධානි පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්***. කැලණිය: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

මධ්‍යම සංස්කෘතික අරමුදල. (2018). ***වාර්ෂික පුරාවිද්‍යා පර්යේෂණ හා කැණීම් වාර්තාව,*** යාපහුව ව්‍යාපෘතිය. කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව. (2001). ***යාපහුව.*** කොළඹ: *පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව.*

පතිරණ, යූ. ජී. එස්. (2001). ***ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය*** වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.